සැ.යු.- 2017.06.16 දින පළ වූ අංක 2024 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,025- 2017 ජුනි මස 23 වැනි සිකුරාදා - 2017.06.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1006 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1009 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ***ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 ජූලි මස 14 දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 ජුනි මස 30 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය.**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# තනතුරු - ඇබෑර්තු

## දකුණු පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

### ඇල්පිටිය ප්‍රාදේශීය සභාව

ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට නියමිත සුදුසුකම් සපුරා ඇති දකුණු පළාත් සභා සීමාව තුළ ස්ථිර පදිංචි කරුවන්ගේ අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *මාසික වැටුප් පරිමාණය* | *බඳවා ගැනීමේ අවම අධ්‍යාපන සුදුසුකම්/ අමතර සුදුසුකම්* |
|---|---|---|---|
| රියදුරු III ශ්‍රේණිය | 01 | PL3-2016 Grade III<br>රු. 25,790 - 270x10 - 300x10-330x10 -350x12 - රු. 38,990 | 1) දෙවරකට නොවැඩි වාර ගණනක දී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් ඕනෑම විෂයයන් 06ක් සමත් වීම.<br>2) පුරප්පාඩුව පවතින මෝටර් රථ වර්ගයෙහි රියදුරු තනතුරුවල ස්වභාවය වන රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් හා නිපුනත්වය පිළිබඳව සහතිකයක් ලබා සිටිය යුතු ය. මෝටර් රථ රියදුරන් රියදුරු බලපත්‍රය ලැබීමෙන් පසු අවම වශයෙන් වසර තුනක පළපුරුද්දක් ලබා තිබිය යුතු ය. |
| කාර්යාල කාර්ය සහායක III ශ්‍රේණිය | 01 | PL1-2016 Grade III<br>රු. 24,250 - 250x10 - 270x10-300x10 -330x12 - රු. 36,410 | 3) අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06 කට නොඅඩුව සම්මාන සාමාර්ථ දෙකක් සහිතව සමත් වී තිබිය යුතු ය. |

02. *වයස් සීමාව* :-

I. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු 45ට නොවැඩි විය යුතු ය. (දැනට ස්ථිර සේවයේ නියුක්ත අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)

03. *පොදු සුදුසුකම්* :-

I. අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙක් විය යුතු ය.

II. අයදුම්කරුවන් දකුණු පළාත් සභා සීමාව තුළ අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්න වසර තුනක කාලයක් ස්ථිර පදිංචි කරුවෙකු විය යුතු ය. ඇල්පිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පදිංචි කරුවන්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

III. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය. තෝරාගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර එම පරීක්ෂාවේ දී ශාරීරික වශයෙන් නුසුදුස්සෙකු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.

IV. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබුවෙකු හෝ රාජ්‍ය සේවයෙන් හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතු ය.

V. අයදුම්කරුවන්ට අදාළ තනතුර සඳහා සඳහන් වී ඇති අවම සුදුසුකම් තිබිය යුතු ය.

04. *පොදු කොන්දේසි :-*

I. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාලසීමාවේ දී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලය ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු ය.

II. දැනට ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුක්ත ස්ථිර, ආදේශක සේවකයින්ට ප්‍රමුඛතාවය දෙනු ලැබේ.

05. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

I. මෙම තනතුර ස්ථිරය.

II. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට යටත්විය යුතු ය.

III. පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ.

06. මෙම බඳවාගැනීමේ කොන්දේසි හා රෙගුලාසි වලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි වලට ද, දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝග වලට ද, දකුණු පළාත් සභාවේ හෝ දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝග වලටද අනුකූලව සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.

07. *බඳවාගැනීමේ ක්‍රමය* :

I. සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගනු ලැබේ.

08. අයදුම්පත් එවිය යුතු ආකාරය :
අයදුම්පත්‍රය සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කරන ලද පිටපතක් ද අමුණා එවිය යුතු ය.

I. උප්පැන්න සහතිකය

II. අධ්‍යාපන සහතිකය

III. පදිංචිය සනාථ කිරීමේ සහතිකය (පදිංචි ග්‍රාම නිලධාරී විසින් නිකුත් කරන ලද සහතිකය අදාළ ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිතව මාස 06 ක් තුළදී ලබාගත් ග්‍රාමසේවා සහතිකය.)

IV. මැතක දී ලබාගත් චරිත සහතික 02 ක්

V. වෘත්තීය හෝ පළපුරුද්ද පිළිබඳ සහතික (තිබේ නම්)

VI. සේවා පළපුරුද්ද පිළිබඳ සහතික.

මෙම නිවේදනයේ දක්වා ඇති ආදර්ශ අයදුම් පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් 2017.07.07 දිනට පෙර ලේකම්, ඇල්පිටිය ප්‍රාදේශීය සභාව, ඇල්පිටිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු ය. (අයදුම්පත A4 ප්‍රමාණයේ කඩදාසිවල සකස් කළ යුතු ය.) අසම්පූර්ණ, අපැහැදිලි මෙන්ම නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ද කිසිඳු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ලේකම්,
ඇල්පිටිය ප්‍රාදේශීය සභාව,

2017 ක් වූ ජූනි මස 01 වැනි දින,
ඇල්පිටිය ප්‍රදේශීය සභා කාර්යාලයේ දී.

**ආදර්ශ අයදුම් පත්‍රය**

***ඇල්පිටිය ප්‍රාදේශීය සභාව***

............................................................ තනතුර සඳහා අයදුම් පත්‍රය

01. නම:- ..........................................................................................................
මුලකුරු වලින් හැඳින්වෙන නම:- ...................................................................
02. ස්ථිර ලිපිනය:- ............................................................................................
03. දිස්ත්‍රික්කය:- ................................................................................................
04. උපන් දිනය
අවුරුද්ද:-.......................... මාසය:-.......................... දිනය:-........................

05. ජාතික හැඳුනුම්පත් අංකය:- ......................................................................................

06. ස්ත්‍රී/ පුරුෂ භාවය:- ......................................................................................

07. අයදුම්පත් භාරගන්නා 2017.07.07 දිනට වයස:-

අවුරුදු:-.......................... මාස:-.......................... දින:-........................

08. විවාහක/ අවිවාහක බව:- ......................................................................................

09. ජාතිය:- ......................................................................................

10. ඔබ ශ්‍රී ලාංකිකයෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචියෙන් ද යන වග:-

......................................................................................

11. අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර):-

(I) සමත් වූ වසර / ශ්‍රේණිය: ..................................................................

(II) අ.පො.ස. (සා/පෙළ) විභාගය: ..................................................................

විභාග අංකය : ..................................................................

විභාග වර්ෂය හා මාසය : .......................................................

සමත් වූ විෂයන් : ..................................................................

| විෂය | ශ්‍රේණිය | විෂය | ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

(II) අ.පො.ස. (උ/පොළ) විභාගය: ..................................................................

විභාග අංකය : ..................................................................

විභාග වර්ෂය හා මාසය : .......................................................

සමත් වූ විෂයන් : ..................................................................

| විෂය | ශ්‍රේණිය |
|---|---|
| | |
| | |
| | |
| | |

12. වෘත්තීය සුදුසුකම් (සහතික මගින් සනාථ කළ යුතුයි):- ..........................................................

13. සේවා පළපුරුද්ද :- ......................................................................................

14. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?:- ..........................

එසේ නම් තොරතුරු ......................................................................................

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරාගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව දන්වමි.

දිනය : ...................... . .................................,

අයදුම්කරුගේ අත්සන.

06-736

# පළාත් පාලන නිවේදන

## පේදුරුතුඩුව නගර සභාව

1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

261 වන අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව පේදුරුතුඩුව නගර සභාව විසින් 2017.06.01 වැනි දින පෙදුරුතුඩුව නගර සභාව පහත සඳහන් තීරණය ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

පී. රමෙස්වරන්,
ලේකම්,
පෙදුරුතුඩුව නගර සභාව.

පේදුරුතුඩුව නගර සභාව,
පේදුරුතුඩුව.

2017 ජුනි මස 01 වැනි දින,

**2017.06.01 වැනි දින අංක 128 දරන තීරණය**

"1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) ඡේදය සමග කියවිය යුතු 261 වන අධිකාරය වන 1952 අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ (2) වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ උතුරු පළාතේ පළාත් සභාවේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර උතුරු පළාතේ පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා විසින් සාදනු ලදුව 2016.02.02 වන දින අංක 1952/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළකරනු ලැබූ උතුරු පළාතේ පළාත් සභාව විසින් 2017.02.21 වැනි දින ස්ථිර කරන ලද 2017.03.24 වැනි දින අංක 2011/25 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV (ආ) කොටසේ පළකරනු ලැබූ නිවේදනයෙන් ප්‍රකාශයට පත්කරන ලද්දවූ ද නගර සභාවල සම්මත අතුරු ව්‍යවස්ථා අංක 01 සිට අංක 06 දක්වා වූ කොටස්වල දක්වෙන සම්මත අතුරු ව්‍යවස්ථා මේ තීරණය *ගැසට් පත්‍රයේ* පළකරනු ලබන දින සිට ක්‍රියාත්මක කිරීමට පිළිගැනීමට ඉහත කී පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 3 වන වගන්තියේ (1) උප වගන්තිය යටතේ පේදුරුතුඩුව නගර සභාව තීරණය කරන්නී ය."

06-721

---

## නාරම්මල ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර නාරම්මල ප්‍රාදේශීය සභාව විසින් 2015.05.03 දින තීරණ අංක 2794 යටතේ මෙහි පහත සඳහන් යෝජනාව සම්මත කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්.ජේ.එම්.එම්.එස්. ජයසුන්දර,
ලේකම්,
නාරම්මල ප්‍රාදේශීය සභාව.

2017 මැයි මස 17 වැනි දින.

යෝජනාව

" 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර නාරම්මල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වරිපනම් කාර්යය සඳහා යම් ගෙයක, ගොඩනැගිල්ලක, ඉඩමක හෝ ගෙපතක වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමේ කාර්යය සඳහා සහ හෝ අක්කර බද්දේ කාර්යය සඳහා යම් වගාකළ ඉඩමක විශාලත්වය තක්සේරු කිරීම සඳහා ද ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කෙරෙන සංවර්ධන කාර්යයන් සැලසුම් කිරීම පහසු කිරීමත් සහ 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 03 වන සහ 05 වන වගන්ති වල කාර්යය සඳහා තොරතුරු පද්ධතියක් නිර්මාණය කරගැනීම සඳහා ද එකී යම් දේපළක අයිතිකරුට සහ පදිංචිකරුට එහි කුලිය හෝ වාර්ෂික වටිනාකම හෝ එහි විශාලත්වය සහ වෙනත් කරුණු පිළිබඳ වාර වාර්තා සපයීම නියම කළයුතු යයි නාරම්මල ප්‍රාදේශීය සභාව යෝජනා කරන්නීය.".

07-722

**නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව**

වාර වාර්තා සපයන ලෙස නියම කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට එකී පනතේ 9 වන වගනිතියේ (3) වන උප වගන්තියෙන්, එකී ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 2017.05.24 වැනි දින තීරණ අංක 11087 යටතේ මෙහි පහත සඳහන් තීරණය ගෙන ඇති බව මහජනාතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

කේ. පී. චන්දන කුමාර,  
ලේකම්,  
නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාව.

2017 මැයි මස 31 වැනි දින,

**තීරණය**

" 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 139 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර, නාත්තන්ඩිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වරිපනම් කාර්යය සඳහා යම් ගෙයක, ගොඩනැගිල්ලක, ඉඩමක හෝ ගෙපතක වාර්ෂික වටිනාකම තක්සේරු කිරීමේ කාර්යය සඳහා සහ හෝ අක්කර බද්දේ කාර්යය සඳහා යම් වගාකළ ඉඩමක විශාලත්වය තක්සේරු කිරීම සඳහා ද, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කෙරෙන සංවර්ධන කාර්යයන් සැලසුම් කිරීම පහසු කිරීමත් සහ 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ 03 වන සහ 05 වන වගන්තිවල කාර්යය සඳහා තොරතුරු පද්ධතියක් නිර්මාණය කරගැනීම සඳහා ද එකී යම් දේපළක අයිතිකරුට සහ පදිංචිකරුට එහි කුලිය හෝ වාර්ෂික වටිනාකම හෝ එහි විශාලත්වය සහ වෙනත් කරුණු පිළිබඳ වාර වාර්තා සපයන ලෙස නියම කළයුතු යයි නාත්තන්ඩිය ප්‍රාදේශීය සභාවේ බලතල කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට එකී පනතේ 9 වන වගන්තියේ (3) වන උප වගන්තියෙන්, එකී ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වශයෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මම මෙයින් තීරණය කරමි.".

06-785

---

**වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව**

සම්මත අතුරු ව්‍යවස්ථාව පිළිගැනීම

**1952 වසරේ අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත**

1989 වසරේ අංක 12 දරන පළාත් සභා (අනුෂාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) වන ඡේදය සමඟ

කියවිය යුතු 1952 වසරේ අංක 6 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් පළාත් සභාවේ පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව උතුරු පළාතේ ප්‍රධාන අමාත්‍යතුමා විසින් සාද 2017.03.24 දින අංක 2011/25 ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථා 2017.05.02 දිනැති අංක 4 පරිපාලන නියෝගයට අනුව වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාවේ පිළිගන්නා ලද බව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 123(2) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඉ. බකීරතන්,  
ලේකම්,  
වලිකාමම් උතුරු ප්‍රාදේශීය සභාව,  
කන්කසන්තුරෙයි.

06-786

## මහරගම නගර සභාව

### නගර සභා ආඥා පනත යටතේ (255 වන අධිකාරිය) 50 හා 52 වන වගන්ති ප්‍රකාර කරනු ලබන දැන්වීම

නගර සභා ආඥා පනතේ 255 වන අධිකාරිය 50 හා 52 වන වගන්ති ප්‍රකාර බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහරගම නගර සභා සීමාවේ පිහිටි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් මහරගම නගර සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම මහසභාව තීරණය කර ඇත.

02. මේ පිළිබඳව පොදු ජනතාව හෝ අදාළ දේපල හිමියන් විසින් විරුද්ධත්වයක් දක්වන්නේ නම් එසේ විරුද්ධ වීමට හේතු මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දින සිට එක් මාසයක් ඇතුලත ලිඛිතව ඉදිරිපත් කළ යුතුය.

03. මෙම කාල සීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් මෙම උපලේඛනයේ සඳහන් පාරවල් මහරගම නගර සභාව සතු පාරවල් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බව මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ලේකම් හා සභාවේ බලතල, කාර්ය,
කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
මහරගම නගර සභාව.
ලේකම් *(වැ.බ).*

2017 ජුනි මස 06 වැනි දින.

| *අනු. අංකය* | *සැලසුම් අංකය හා දිනය* | *මාර්ගයේ නම* | *මාර්ගයේ දිග* | *මාර්ගයේ පළල* | *උපලේඛනය අනුව සීමාවන්* |
|---|---|---|---|---|---|
| 01) | සැලසුම් අංකයඃ 2330<br>දිනයඃ 1997.12.25 | පන්නිපිටිය කොට්ටාව හොරහේන පාරේ ආසිරි මාවත | මී.159 | මී.6.0 | උතුරටඃ- මෙම පිඹුරේ ලොට් අංක 01<br>දකුණටඃ හොරහේන පාරේ අතුරු පාරක්<br>බටහිරටඃ- මෙම පිඹුරේ ලොට් අංක 2, 3, 4, 5, 6, 7, 8, 9, 10, 11, 12<br>නැගෙනහිරටඃ මෙම පිඹුරේ කැබලි අංක E |

| *අනු. අංකය* | *සැලසුම් අංකය හා දිනය* | *මාර්ගයේ නම* | *මාර්ගයේ දිග* | *මාර්ගයේ පළල* | *උපලේඛනය අනුව සීමාවන්* |
|---|---|---|---|---|---|
| 01) | සැලසුම් අංකයඃ 3312<br>දිනයඃ 17.04.25 | ගල්පොත්ත පාර අතුරු පාර 240/16 F සිට 240/16 C දක්වා මාර්ගය | මී.60 | මී.3 | උතුරටඃ- වීරකෝන්ගේ ඉඩම<br>දකුණටඃ ගල්පොත්ත පාර<br>බටහිරටඃ- ඒ. ආනන්ද මහතාගේ ඉඩම<br>නැගෙනහිරටඃ එම්. කේ. ටී. හේමා දිල්හානිගේ ඉඩම |

06-888

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.